# මාධ්‍ය නිවේදනය

## පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2026

2026 දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිත "පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2026" සඳහා මාර්ගගතව අයදුම්පත් කැඳවනු ලැබේ.

උක්ත විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි මූලික පිරිවෙන්, මහ පිරිවෙන්, සීලමාතා අධ්‍යාපන ආයතන හා විශේෂ පිරිවෙන්වලට අදාළ පරිශීලක නාම හා මුරපද මේ වන විට නිකුත් කර ඇත. පරිශීලක නාම හා මුරපද නොලද ලියාපදිංචි පිරිවෙන් වේ නම්, ඒ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශයෙන් විමසිය යුතුය.

අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "Piriven Exam Information Center" වෙත පිවිසෙන්න.

මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කර ඇත.

මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026 අගෝස්තු මස 24 දින පෙ.ව. 9.00ට ආරම්භ වන අතර 2026 සැප්තැම්බර් මස 24 දින ප.ව. 9.00ට අවසන් වේ.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2026 අගෝස්තු මස 21 වන දින.